සංචාරක අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්තයේ මානව සම්පත් සංවර්ධනය උදෙසා අධ්‍යාපනය ලබාදෙනු ලබන ප්‍රමුඛතම ජාතික පුහුණු ආයතනය ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයයි (SLITHM)

## තනතුරු ඇබෑර්තු

## නියෝජ්‍ය අධ්‍යක්ෂක ජෙනරාල් (අධ්‍යයන)

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර (අධ්‍යයන) SLITHM හි කොළඹ සහ සියලුම පළාත් පාසල්වල අධ්‍යයන කටයුතු සඳහා වගකීමට බැඳී සිටී. SLITHM හි සියලුම අධ්‍යයන ආශ්‍රිත කටයුතුවල පරමාර්ථ හා අරමුණු ක්‍රියාත්මක කිරීමේදී SLITHM හි අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රධාන විධායක නිලධාරී), සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය.**

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආර්ථික විද්‍යාව/ කළමනාකරණය /සංචාරක / අධ්‍යාපන පිළිබඳ ප්‍රථම උපාධිය

**සමග**

ව්‍යාපාර පරිපාලනය/ සංචාරක/ ආර්ථික විද්‍යාව/ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම (විද්‍යාවේදී)

**සහ**

රාජ්‍ය, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල /ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකාරීත්ව මට්ටමේ තනතුරක වසර 18 ක අවම පළපුරුද්ද.

**හෝ**

ව්‍යාපාර පරිපාලනය/ සංචාරක/ ආර්ථික විද්‍යාව/ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සමග SLITHM හි පූර්ණ උපාධිධාරීත්වය.

**සහ**

රාජ්‍ය, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල /ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකාරීත්ව මට්ටමේ තනතුරක වසර 20 ක අවම පළපුරුද්ද.

**වයස**

වයස අවුරුදු 35ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින්ට ඉහළ වයස් සීමාව අදාළ නැත.

**වැටුප**

වැටුප් පරිමාණය- HM 1-3 වර්ගය - රු. (86,865/= - 15 x 2,270/= -120,915/=)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2016 අනුව මූලික වැටුප් පියවර රු. 86,865/= + ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ. ඊට අමතරව, රු. 50,000/=ක වාහන දීමනාව හා ඉන්ධන ලීටර් 120 සහ රු.3,000/=ක වෘත්තීය දීමනාව සහ දුරකථන දීමනාව රු. 5,000 ක් මාසිකව ගෙවනු ලැබේ.

- **සාමාන්‍ය තොරතුරු:**
- රාජ්‍ය සහ ව්‍යාවස්ථාපිත මණ්ඩලයේ දැනට සිටින සේවකයින් තම අයදුම්පත් ආයතනයේ ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතුය.
- **EPF & ETF සඳහා දායකත්වය:**

අර්ථසාධක ගෙවීම් - සේවකයා මාසික වේතනයෙන් 10% ක්ද සේව්‍යයා 15% ක්ද අරමුදලට බැර කරනු ලැබේ.
සේවක භාරකාර අරමුදල- සේව්‍යයා විසින් 3% ක ප්‍රමාණයක් අරමුදලට බැර කරනු ලැබේ.
සේවකයාට සහ ඔහුගේ / ඇයගේ පවුලේ සාමාජිකයින්ට ආකර්ෂණීය සෞඛ්‍යාරක්ෂණාවරණයකට හිමිකම් ලබනු ඇත.

**ඉල්ලුම් කරන තනතුර කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන්කොට ඉල්ලුම්පත සමග අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව සහතික පත්වල සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ඇතුළුව ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහිතව සකස් කළ අයදුම්පත 2021 පෙබරවාරි 19 වැනි දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න.**

**අධ්‍යක්ෂ ජෙනරාල්**
**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය,**
**අංක 78, ගාලු පාර, කොළඹ 03.**

**විමසීම්:- 0112 208 360**